# ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
## රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය

**<u>පහල ගලතුර ප්‍රජා මූල සංවිධානය විදුලි බිල අඩු කරගත් අපූරු උපක්‍රමය</u>**




පහල ගලතුර ප්‍රජා මූල සංවිධානය අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති සාර්ථකම ප්‍රජා ජල යෝජනා ක්‍රමයකි. නිවාස 185ක් සඳහා ගලතුර ගඟ අසල නොගැඹුරු ළිඳක් ජල මූලාශ්‍රය කරගනිමින් පොම්පීය ක්‍රමයට ජලය ලබා ගෙන වාතක, රළු පෙරහන හා වැලි පෙරහන මඟින් පිරිපහදු කර ක්ලෝරීන් කිරීමෙන් අනතුරුව සාමාජිකයන්ට ජලය ලබා දේ. ප්‍රජා මූල සංවිධානයට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ රත්නපුර කාර්යාලය මඟින් ඉදිකළ මෙම ජල යෝජනා ක්‍රමය මේ වන විට වසර 5ක් තම සාමාජික නිවාස වෙත ජලය පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ලබාදීමට සැමවිටම කටයුතු කරයි.

මෙම ප්‍රජා මූල සංවිධානයේ මහසභාවට අයවැය ඉදිරිපත් කරන අවස්ථාවේ රු. 75, 000.00 වැය විදුලි බිලක් ප්‍රජා මූල සංවිධානයට මාසිකව ගෙවිය යුතු බවත් එම මුදල ප්‍රජා මූල සංවිධනයේ ඉදිරි පැවැත්මට බාධාවක් වියහැකි බවත් විශේෂයෙන් නඩත්තු අරමුදල ශක්තිමත්ව පවත්වා ගැනීමට මෙය විශාල බාධාවක් බව මා හඳුනාගන්නා ලදී. සංවිධානයේ විධායක සභාව මෙන්ම සාමාජිකයන්ද අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරන්නට විය.

මාගේ යෝජනාව වූයේ මෙම ටැංකියට ඉහලින් වැසිකාලයට පමණක් හෝ ගලාබසින දියපහරවල් ඇතිද යන්නයි. එහිදී එම කඳු ප්‍රදේශය පිලිබඳ අවබෝධයක් ඇති සාමාජිකයන් කියා සිටියේ ඒවා වැස්ස නැවතීමත් සමඟ සිඳීයන බවත් ඒවායේ උල්පත් පමණක් ඇති බවත්ය. එම ප්‍රදේශයේ වනාන්තරය පමණක් ඇති බවත් නිවාස හෝ ජලය දූෂණය වන අවස්ථා නොමැති බවටත් තහවුරු විය. ඒ අනුව මෙම ජල පහරවල් වසරේ මස 2ක් හෝ 3ක් පවතින බවත් තහවුරු කරන ලදී.

අප විසින් නොපමාව මෙම ප්‍රදේශයේ ප්‍රජා මූල සංවිධාන නායකයින් සමඟ පරීක්ෂා කර අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව පුංචි වියදමකින් කුඩා තුලුමුවක් සකස් කර 32mm නළයක් මඟින් ජලය ලබා ගැනීමට ප්‍රජා මූල සංවිධානයට උපදෙස් ලබා දෙන ලදී. එහිදී, ටැංකිය හා ජල මූලාශ්‍රය අතර උස්මට්ටම්, මූලාශ්‍රයේ අවසරය හා ප්‍රජා මූල සංවිධානය සතු අරමුදල් ප්‍රශ්නය අප විසින් සැලකිල්ලට ගන්න ලදී.

ඒ අනුව ප්‍රජා මූල සංවිධානය තාක්ෂණ හා මූල්‍ය සැලැස්ම ඉදිරිපත් කර අනුමත කර නොපමාව ඉදිකිරීම් සිදු කරන ලදී. ඒ අනුව ඉදිකිරීම් අවසන් කර මේ වනවිට වසර 3ක් ඉක්මගොස් ඇත. මෙම ප්‍රජා මූල සංවිධානය සඳහා වසරකට විදුලි බිල රු. 75,000.00 වැනි බිල්පත් ගෙවා ඇත. තාවකාලික ජල මූලාශ්‍රය සම්බන්ද කිරීම මඟින් මෙම විදුලි බිල මාසිකව රු. 15,000.00 – 25,000.00 දක්වා වැසි සහිත මාස වලදී අඩුකරගෙන ඇත. ඒ අනුව වර්ෂයකට විදුලි බිලෙන් ලක්ෂ 3ක් වැනි විශාල මුදලක් ඉතිරිව ප්‍රජා මූල සංවිධානයේ සාර්ථකත්වයට විශාල පිටුවහලක් බව සනාථ වී ඇත.

මෙම වැඩසටහන මඟින් ලබාගත් සාර්ථක ප්‍රතිපල

- මාසික නඩත්තු වියදම අවමවීම තුලින් නඩත්තු අරමුදල ශක්තිමත් වීම.
- රටේ විදුලිය සඳහා වැයවන ඩොලර් ප්‍රමාණය ඉතිරි වීම.
- වර්ෂා කාලයට අපතේ යන ජලය ප්‍රයෝජනයට ගැනීම.
- මෙවැනි හැකියාවක් ඇති ප්‍රජා මූල සංවිධාන සඳහා භාවිතා කළහැකි ආදර්ශයක් ගොඩනගා ඇත.

**පිටපත** : ස්ථාන භාර නිලධාරී (රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය)